# අවිලාහි තෙරේසා තුමියගේ 'අභ්‍යන්තර ප්‍රාසාදය' නම් ග්‍රන්ථය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම්. චෙරිල් ප්‍රනාන්දු[1]

අවිලාහි තෙරේසා තුමිය යනු සභා ධර්මධාරීන් අතර සිටින කාන්තාවන් තිදෙනාගෙන් කෙනෙකි. එතුමියගේ ග්‍රන්ථ අතරින් 'The Interior Castle or the Mansion' හෙවත් 'අභ්‍යන්තර ප්‍රාසාදය' ග්‍රන්ථයෙහි මහල් හත (seven mansions) පිළිබඳ පුළුල් විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මේ පර්යේෂණයේ ප්‍රධාන අභිමතාර්ථය යි. එතුමියගේ ජීවිතය හා ග්‍රන්ථ ද, චින්තනය ගොඩනැගුණු ස්පාඤ්ඤයේ පසුබිමත්, මහල් හත හා ඇගේ පණිවුඩය ශ්‍රී ලාංකේය සමාජයට අභියෝගයක් වන අයුරුත් විමසා බලයි. අභ්‍යන්තර ප්‍රාසාදයෙහි මහල් හත පිළිබඳ ව Bill O' Byrne ගේ "Conversion in the Teresian Mansions" ප්‍රකාශයෙහි ග්‍රන්ථයේ අවිලා තුමිය ක්‍රිස්තුස් වහන්සේ මුදුන් පමුණුවා නොමැත, ගැලවීම සඳහා අප වෙහෙස විය යුතු යැ යි පවසයි. ශුභාරංචි දේශකයෝ ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය හා ප්‍රාතිහාර්ය මුදුන් පමුණුවති; ගැලවීම ලැබීම හුදෙක් දේව භක්තියෙන් ලබාගත හැකි යැ යි පවසති. Gladys Mcmullin ගේ "The Interior Castle 5th Centenary Preparation" යන ලිපියෙහි මහල් හත කොටස් දෙකකට බෙදයි. පළමු වැනි, දෙ වැනි, තෙ වැනි මහල් දේව වරප්‍රසාදයෙහි අප උත්සාහයෙන් ලබාගත යුතු වෙයි. ඉතිරි මහල්වලට නොදැනුම්වත් ව ම ඇතුළුවිය හැකි ය. මේ සියලු උපකල්පන අධ්‍යනයේ දී අවිලාහි තුමියගේ මහල් හතට ඇතුළුවීම සඳහා තමා සිටින ස්ථානය හැඳිනගත යුතු බව පැවසෙයි. එතුමිය පවසන මහල් හතෙහි මහලින් මහල යනු අප ජීවිත පියවර යි. "මම" කාරකයෙහි සිර ව සිටින ආත්මයට පළමු මහලට වත් ගමන් කළ නොහැකි වෙයි. විෂඝෝර සර්පයන් වට කරගන්නා වූ එය තබන්නා වූ පළමු පියවරින් ම අසාර්ථක වෙයි. තණ්හාව නොමැති අල්පේච්ඡ ජීවිත පැවතුමකින් හත් වැනි මහල කරා පියවර තැබිය හැකි ය.

**ප්‍රමුඛ පදඃ** අවිලාහි තෙරේසා තුමිය, අභ්‍යන්තර ප්‍රාසාදය ග්‍රන්ථය, මහල් හත, ආත්මය

[1] බටහිර සම්භාව්‍ය හා ක්‍රිස්තියානි සංස්කෘති අධ්‍යයන අංශය